මාධ්‍ය නිවේදනය
2008/12/31

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා ගේ ප්‍රධානත්වයෙන් සෙලාන් බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරි අජිත පැස්කුවල් මහතා සහ සෙලාන් බැංකුවේ ආයතන කළමනාකාරිත්වය,මුල්‍ය මණ්ඩලය මගින් පත්කරනු ලැබූ සෙලාන් බැංකුවේ නව අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් වන ඊ නාරන්ගොඩ මහතා (සභාපති) ලලිත් විතාන මහතා,ජනාධිපති නීතිඥ නිහාල් ජයමාන්න මහතා සහ නියොමාල් ගුණවර්ධන මහතා සහභාගී වූ විශේෂ සාකච්ඡාවක් ශ්‍රී ලංකා මහ බැංකු පරිශ්‍රයේදී සිදුවිය.

එම අවස්ථාවට ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති ඩබ්ලිව්.ඒ විජෙවර්ධන මහතා, නියෝජ්‍ය අධිපතිනී රානි ජයමහ මහත්මිය, ඇතුළු ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් පිරිසක්ද ඊට එක්විය.

මීට අමතරව ලංකා බැංකුවේ සභාපති ආචාර්ය ගාමිණී වික්‍රමසිංහ මහතා ගේ ප්‍රධානත්වයෙන් සාමාන්‍යධිකාරි බී.ඒ.සී ප්‍රනාන්දු මහතා,ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යධිකාරිනී ඩබ්ලිව්.ඒ.නාලිනී මහත්මිය ඇතුළු නිලධාරි පිරිසක් ලංකා බැංකුව වෙනුවෙන් සහභාගී විය. මෑත කාලයේ ඇතිවූ සිද්ධීන් ඔස්සේ සෙලාන් බැංකුවේ ඇතැම් තැන්පත් කරුවන් තුල විවිධ මත ඇතිවීම හේතුවෙන් මුදල් මණ්ඩලය මගින් විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට යොමුවීමේ ප්‍රතිපලයක් ලෙස සෙලාන් බැංකුවේ ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාම සඳහා ලංකා බැංකුව පත්කිරීම,සෙලාන් බැංකුව සඳහා නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කිරීම සමගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ හා ලංකා බැංකුවේ පුර්ණ සහයෝගය පල වීම සිදුවිය.

ඒ සමගම ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමා සඳහන් කලේ ශ්‍රී ලංකාවේ මුල්‍ය ක්ෂේත්‍රයේ ස්ථාවරභාවය සුරැකීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව හා මුදල් මණ්ඩලය මෙවනි පියවරක් ගැනීමට යොමුවූ බවයි.

නව කළමනාකාරිත්වය මගින් ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රයේ විශේෂයෙන්ම සෙලාන් බැංකුව පිළිබඳව මහජන විශ්වාසය තවදුරටත් තහවුරු කිරීමට උපකාරවනු ඇත.

ශ්‍රී ලංකාවේ විශාලතම වානිජ බැංකුව වන ලංකා බැංකුව,සෙලාන් බැංකුවේ ව්‍යාපාර කටයුතු සඳහා ශක්තියක් එක් කරනු ඇත.එම නිසා සමස්ථ මහජනතාවට විශේෂයෙන් සෙලාන් බැංකු ගණුදෙනු කරුවන්ට කිසිදු බාධාවකින් තොරව හා ක්‍රමවත්ව සිය බැංකු කටයුතු කල හැකි බවට තහවුරු කර තිබේ.